සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

ව්‍යාපාර අධ්‍යයනය I
வணிகக் கல்வி I
Business Studies I

32 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- ※ **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
- ※ ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ※ ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- ※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

විභාග අංකය : ..............................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

**1.** පහත සඳහන් කරුණු අතුරෙන් වුවමනාවල ලක්ෂණ පමණක් අඩංගු පිළිතුර කුමක් ද?
(1) අසීමිත වීම, විවිධ වීම හා පොදු වීම
(2) ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැකි වීම, පොදු වීම හා සීමිත වීම
(3) පුද්ගලබද්ධ වීම, සීමිත වීම හා විවිධ වීම
(4) අසීමිත වීම, විවිධ වීම හා පුද්ගලබද්ධ වීම
(5) පොදු වීම, ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැකි වීම හා විවිධ වීම (.........)

**2.** ආර්ථිකයේ විවිධ අංශවලට අයත් ව්‍යාපාර කටයුතු කිහිපයක් පහත දැක්වේ. ඒ අතුරෙන් සේවා අංශයට අයත් ව්‍යාපාර කටයුතු දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ගෘහ කර්මාන්තය හා ආනයන වෙළෙඳාම
(2) කුරුඳු ආශ්‍රිත නිමැවුම් සැකසීම හා ප්‍රවාහනය
(3) ඉදිකිරීම් හා ගෑස්
(4) ප්‍රවාහනය හා ධීවර කටයුතු
(5) සන්නිවේදනය හා ප්‍රවාහනය (.........)

**3.** පහත සඳහන් යුගල අතුරෙන් නොසෙවු භාණ්ඩ සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.
(1) ජීවිත රක්ෂණය හා පුද්ගල හදිසි අනතුරු රක්ෂණය
(2) මෝටර් රථය හා මෝටර් රථ රක්ෂණය
(3) පුද්ගල හදිසි අනතුරු රක්ෂණය හා නිවස
(4) ප්‍රවෘත්ති පත්‍රය හා මෝටර් රථය
(5) නිවස සහ ගිනි රක්ෂණය (.........)

**4.** පහත වගුවේ දැක්වෙන්නේ කේවල ස්වාමි ව්‍යාපාරයක කටයුතු සඳහා බලපාන අභ්‍යන්තර බලවේග සහ ශක්තීන් කිහිපයකි.

| අභ්‍යන්තර බලවේග | ශක්තීන් |
|---|---|
| A. සංවිධාන ව්‍යුහය | 1. පළපුරුද්ද |
| B. හිමිකරු | 2. යාවත්කාලීන බව |
| C. සේවකයින් | 3. කීර්තිනාමය |
| D. භාවිත කරන සම්පත් | 4. තීරණ ගැනීමේ පහසුව |

ඉහත වගුව සැලකිල්ලට ගනිමින් අභ්‍යන්තර බලවේග හා ශක්තීන් නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.
(1) A - 1, B - 2, C - 4, D - 3
(2) A - 4, B - 2, C - 3, D - 1
(3) A - 4, B - 3, C - 1, D - 2
(4) A - 3, B - 4, C - 2, D - 1
(5) A - 2, B - 1, C - 3, D - 4 (.........)

**5.** පහත වගුවේ **X** හා **Y** තීරු මගින් ව්‍යාපාරයක ආසන්න පරිසර බලවේග දෙකක් ද, අවස්ථා හා තර්ජන ලැයිස්තුවක් ද පිළිවෙළින් දැක්වේ.

| X | Y |
|---|---|
| A. ආදේශන භාණ්ඩ නිපදවන්නෝ | 1. කර්මාන්තයේ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම |
| | 2. පාරිභෝගිකයින් භාණ්ඩ සන්නම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම |
| B. කර්මාන්තයේ තරගකාරිත්වය | 3. බුද්ධිමය දේපළ හිමිකම පිළිබඳ නීතිය ලිහිල් කිරීම |
| | 4. වෙළෙඳපොළින් ඉවත් වීමට සීමා පැවතීම |

ආසන්න පරිසර බලවේග දෙකට අදාළ අවස්ථා හා තර්ජන නිවැරදි ව ගළපා ඇති පිළිතුර තෝරන්න.
(1) A - 2,4 / B - 1,3 (2) A - 2,3 / B - 1,4 (3) A - 1,4 / B - 2,3 (4) A - 1,2 / B - 3,4 (5) A - 3,4 / B - 1,2 (.........)

[ දෙවැනි පිටුව බලන්න.

6. පහත දැක්වෙන්නේ පාරිභෝගික ආරක්ෂණයෙහි වැදගත්කම් කිහිපයකි.
   A - මුදලට සරිලන වටිනාකමක් ඇති භාණ්ඩ ලබා ගැනීමට හැකි වීම
   B - වෙළෙඳ විෂමාචාරවලට එරෙහි ව නීතිමය ආවරණය ලබාගත හැකි වීම
   C - ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය ගොඩනගා ගැනීමට හැකි වීම
   D - ලාභය උපරිම කර ගැනීමට හැකි වීම
   E - කීර්තිනාමය වැඩි කර ගැනීමට හැකි වීම
   F - භාණ්ඩවලින් අපේක්ෂිත ප්‍රමිති හා ආරක්ෂිත අවශ්‍යතා තහවුරු කිරීමට හැකි වීම

ඉහත සඳහන් කරුණු අතුරෙන් පාරිභෝගිකයන්ට පමණක් වැදගත් වන සංයෝජනය තෝරන්න.
(1) A, B, E (2) A, B, F (3) A, C, D (4) C, D, E (5) C, D, F (.........)

7. පහත සඳහන් ආයතන අතුරෙන් පාරිභෝගික ආරක්ෂණ කටයුතුවලට සම්බන්ධ **නොවන** ආයතනය තෝරන්න.
(1) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (2) විදුලි සංදේශ නියාමන කොමිසම
(3) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (4) මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
(5) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (.........)

8. පහත සඳහන් කොන්දේසි අතුරෙන් 1890 හවුල් ආඥාපනතේ 24 වන වගන්තියට අනුව හවුල් ව්‍යාපාරයකට බල **නොපාන** කොන්දේසිය තෝරන්න.
(1) ප්‍රාග්ධනය සඳහා බැංකු පොලියට සමාන පොලියකට හිමිකමක් ඇත.
(2) ලාභාලාභ හවුල්කරුවන් අතර සමානුපාතික ව බෙදාගත යුතු ය.
(3) ඒකමතික ව නව හවුල්කරුවකු බඳවා ගත හැකි ය.
(4) හවුල්කරුවන් පෞද්ගලික ව ව්‍යාපාරය වෙනුවෙන් දැරූ වියදම් ව්‍යාපාරය විසින් ඔවුන්ට ගෙවිය යුතු ය.
(5) සෑම හවුල්කරුවකුට ම ව්‍යාපාරයට සපයන ලද තම සේවාව වෙනුවෙන් වේතනයක් ලැබීමට හිමිකමක් නැත. (.........)

9. පහත කරුණු අතුරෙන් සීමාසහිත පොදු සමාගමක (PLC) දැකිය හැකි ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) වගකීම අසීමිත වන අතර කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කර ඇත.
(2) වගකීම සීමිත වන අතර කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කර නැත.
(3) අවම සාමාජික සංඛ්‍යාව එකක් වන අතර උපරිමය පනහකි.
(4) අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව එකක් වන අතර උපරිමය සීමාවක් නොමැත.
(5) වගකීම සීමිත වන අතර කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි කර ඇත. (.........)

10. පහත සඳහන් දෑ අතුරෙන්, පුද්ගලයකු සමාගමක අධ්‍යක්ෂකවරයකු ලෙස පත් **නොකිරීමට** හේතු විය හැකි කරුණ කුමක් ද?
(1) එම සමාගමේ කොටස්කරුවකු වීම (2) ද්විත්ව පුරවැසිභාවය ලබා තිබීම
(3) බංකොලොත් නොවූ අයකු වීම (4) වෙනත් සමාගමක අධ්‍යක්ෂකවරයකු වීම
(5) තම එකඟත්වය ප්‍රකාශ නොකිරීම (.........)

11. පහත සඳහන් වන්නේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ මූලික පියවර කිහිපයකි. ඒවා අතුරෙන් කුඩා ව්‍යාපාරයක් ඇරඹීමට අදාළ ප්‍රථම පියවර වන්නේ කුමක් ද?
(1) ප්‍රාග්ධන සම්පාදනය (2) වෙළෙඳපොළ සමීක්ෂණයක් කිරීම
(3) ව්‍යාපාර අදහසක් ඇතිකර ගැනීම (4) ව්‍යාපාරික ස්ථානයක් සොයා ගැනීම
(5) ව්‍යාපාරය ලියාපදිංචි කිරීම (.........)

12. පහත වගුවේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ව්‍යවසායකයකුට බලපෑම් කරන සාධක කිහිපයක් හා උදාහරණ කිහිපයක් දැක්වේ.

| සාධක | උදාහරණ |
|---|---|
| A. පුද්ගල පසුබිම් සාධක | 1. ව්‍යාපාර පරපුරකින් පැවතීම |
| B. සමාජීය සාධක | 2. ආත්ම විශ්වාසය |
| C. ව්‍යවසායකත්ව සාධක | 3. සේවා වියුක්තිය |

සාධක හා උදාහරණ නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.
(1) A - 1, B - 2, C - 3 (2) A - 2, B - 1, C - 3 (3) A - 1, B - 3, C - 2
(4) A - 3, B - 2, C - 1 (5) A - 2, B - 3, C - 1 (.........)

13. පහත දැක්වෙන්නේ රටවල් කිහිපයක භාවිත කරන මුදල් වර්ග ලැයිස්තුවකි.

| රට | මුදල් වර්ගය |
|---|---|
| A. ඉතාලිය | 1. වොන් |
| B. ඕස්ට්‍රේලියාව | 2. ඩොලර් |
| C. දකුණු කොරියාව | 3. රින්ගිට් |
| D. මැලේසියාව | 4. යූරෝ |

PAPERMASTER.LK

එක් එක් රටෙහි භාවිත වන මුදල් වර්ගය නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.
(1) A - 1, B - 2, C - 3, D - 4 (2) A - 2, B - 1, C - 3, D - 4 (3) A - 3, B - 2, C - 1, D - 4
(4) A - 4, B - 2, C - 1, D - 3 (5) A - 4, B - 2, C - 3, D - 1 (.........)

**14.** පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉටුකරන කාර්ය කිහිපයකි.
A - මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීම
B - රාජ්‍ය ණය කළමනාකරණය
C - විදේශ විනිමය පාලනය
D - රජයේ ආර්ථික උපදේශක වශයෙන් කටයුතු කිරීම
E - සේවක අර්ථසාධක අරමුදල් කළමනාකරණය
F - ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් යනාදිය සම්බන්ධීකරණය කිරීම
ඉහත සඳහන් කාර්ය අතුරෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉටු කරන නියෝජ්‍යායතන කටයුතු දැක්වෙන කාණ්ඩය තෝරන්න.
(1) A, B, C, D (2) A, B, D, F (3) A, B, E, F (4) B, C, D, E (5) B, C, E, F (.........)

**15.** පහත දැක්වෙන්නේ රක්ෂණ මූලධර්ම කිහිපයකි.
A - හානිපූරණය B - ආදේශනය
C - දායකත්වය D - උපරිම විශ්වාසය
ඉහත සඳහන් මූලධර්ම අතුරෙන් ජීවිත රක්ෂණයට අදාළවන මූලධර්මය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (5) කිසිවක් නොවේ. (.........)

**16.** පහත දැක්වෙන්නේ රක්ෂණය කළ හැකි හා රක්ෂණය කළ නොහැකි අවදානම් වර්ග කිහිපයකි.
A - මෝටර් රථය දිරාපත් වීම B - ගායකයකුගේ කටහඬ
C - මරණය D - වයස් ගත වීම
E - සේවක ඉවත්වීම
ඉහත සඳහන් කරුණු අතුරෙන් රක්ෂණය කළ **නොහැකි** අවදානම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) A, B, C, D (2) A, B, C, E (3) A, B, D, E (4) A, C, D, E (5) B, C, D, E (.........)

**17.** පහත දැක්වෙන සාධක අතුරෙන් ආනයන අපනයන වෙළෙඳාමට බාධාවන ස්වාභාවික සාධකය කුමක් ද?
(1) ආනයන හා අපනයන සීමා කිරීම් (2) අධික තීරුබදු
(3) සංස්කෘතිකමය වෙනස්කම් (4) දැඩි විනිමය ප්‍රතිපත්ති
(5) වෙළෙඳ ගිවිසුම් (.........)

**18.** පහත සඳහන් විද්‍යුත් වෙළෙඳාමේ වාසි අතුරෙන් ව්‍යාපාරයකට පමණක් අදාළ වන වාසිය කුමක් ද?
(1) ගනුදෙනු වේගවත් වීම (2) වෙළෙඳපොළ කොටස පුළුල් වීම
(3) ප්‍රවාහනය පහසු වීම (4) වෙළෙඳපොළ තොරතුරු බහුල වීම
(5) භාණ්ඩ මිල සාපේක්ෂ ව අඩු මට්ටමක පැවතීම (.........)

**19.** පහත සඳහන් වන්නේ සංවිධානයක විවිධ කළමනාකරණ මට්ටම්වල තනතුරු කිහිපයකි.
A - සුපරීක්ෂක B - අලෙවි කළමනාකරු
C - මූල්‍ය කළමනාකරු D - ප්‍රධාන විධායක නිලධාරී
E - පර්යේෂණ හා සංවර්ධන කළමනාකරු F - සුභසාධන නිලධාරී
G - මානව සම්පත් කළමනාකරු H - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
I - නිෂ්පාදන කළමනාකරු J - වැඩ මූලික
මධ්‍ය කළමනාකරණයට පමණක් අයත් තනතුරු ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) A, B, C, F, G (2) A, D, F, H, J (3) B, C, D, E, G (4) B, C, E, F, H (5) B, C, E, G, I (.........)

**20.** පහත දැක්වෙන්නේ සේවකයින් අභිප්‍රේරණය කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රම කිහිපයකි.
A - නිවාස ණය B - සේවක පුහුණුව
C - බලතල විමධ්‍යකරණය D - සේවක රක්ෂණය
E - නිෂ්පාදන දිරි දීමනා F - සේවය අගය කිරීමේ ලිපිය
G - දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය H - පැමිණීමේ දිරි දීමනා
මූල්‍ය අභිප්‍රේරණ ක්‍රම ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) A, B, C, D, E (2) A, C, D, F, G (3) A, D, E, G, H (4) B, C, E, G, H (5) B, D, E, G, H (.........)

**21.** පහත කරුණු අතුරෙන් මෙහෙයුම් කළමනාකරණයට අයත් **නොවන** කාර්යය කුමක් ද?
(1) ආපසු එවුම් බාර ගැනීම (2) භාණ්ඩ මෝස්තරකරණය
(3) ද්‍රව්‍ය මිල දී ගැනීම (4) තත්ත්ව පාලනය
(5) පර්යේෂණ හා සංවර්ධනය (.........)

**22.** නිෂ්පාදන ආයතනයකට අදාළ වියදම් කිහිපයක් පහත දැක්වේ.
A - මාසික සේවක වැටුප් B - කම්හල් රක්ෂණ ගාස්තු
C - අමුද්‍රව්‍ය මිලට ගැනුම් D - අලෙවි කොමිස්
E - හිස් බෝතල් මිල දී ගැනුම් F - වරිපනම්
G - කෑලි ක්‍රමයට වැඩකරන සේවක වේතන H - නිෂ්පාදන ඒකක මත පුරස්කාරය
විචල්‍ය වියදම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) A, B, C, D, E (2) A, B, F, G, H (3) B, E, F, G, H (4) C, D, E, F, G (5) C, D, E, G, H (.........)

PAPERMASTER.LK

66237

**23.** පහත දැ අතුරෙන් සේවා අලෙවි මිශ්‍රයට විශේෂිත වූ විචල්‍ය ඇතුළත් නිවැරදි පිළිතුර කුමක් ද?

(1) වෙළඳ, ප්‍රචාරණය, දීමනා (2) සෘජු අලෙවිකරුවන්, වට්ටම්, සන්නාම

(3) වෛද්‍යවරයා, ස්වයංක්‍රීය සේවා ක්‍රියාවලිය, වයිෆයි (4) සුපරීක්ෂක, තොග, ගුණත්වය

(5) ප්‍රවාහනය, ඇසුරුම්, වයිෆයි (.........)

**24.** පහත දැක්වෙන අලෙවිකරණයේ ප්‍රතිඵල අතුරෙන් පාරිභෝගිකයාට පමණක් වැදගත්වන කාණ්ඩය තෝරන්න.

A - අයිතිකරුවන්ගේ හා සේවකයින්ගේ තෘප්තිය වර්ධනය වීම
B - භාණ්ඩ හා සේවා පරාසය පුළුල් වීම
C - වෙළෙඳපොළ තුළ භාණ්ඩ හා සේවා බහුල වීම
D - ආදායම් බෙදීයාමේ විෂමතාව අඩු වීම
E - වෙළෙඳපොළ පිළිබඳ දැනුම පුළුල් වීම
F - පහසුවෙන් භාණ්ඩ හා සේවා මිල දී ගත හැකි වීම

(1) A, B, D (2) B, E, F (3) C, D, F (4) C, E, F (5) D, E, F (.........)

**25.** පහත දැ අතුරෙන් සේව්‍ය අයිතිවාසිකමක් ලෙස දැක්විය හැක්කේ කුමක් ද?

(1) සංවිධානයේ අරමුණු ඉටුකර ගැනීමට වැඩ කිරීම (2) වැඩ ස්ථානයේ යහපත් ලෙස හැසිරීම

(3) සේවා ගිවිසුම අනුව කාර්ය ඉටු කරවා ගැනීම (4) වැටුපට සරිලන සේවාවක් ලබා දීම

(5) සේවා ගිවිසුමට අනුව කාර්ය ඉටු කිරීම (.........)

**26.** ස්ථිර සේවයට බඳවාගත් සේවකයකු ඔහුගේ/ඇයගේ තනතුරෙහි තහවුරු කිරීමට පෙර හඳුන්වනු ලබන්නේ,

(1) අනියම් සේවකයකු ලෙස ය. (2) තාවකාලික සේවකයකු ලෙස ය.

(3) ආදේශක සේවකයකු ලෙස ය. (4) පරිවාස සේවකයකු ලෙස ය.

(5) කොන්ත්‍රාත් සේවකයකු ලෙස ය. (.........)

**27.** පහත සඳහන් වන්නේ ආයතනයක භාවිත කරන පරිගණකගත කළ විවිධ කළමනාකරණ තොරතුරු උප-පද්ධති කිහිපයකි.

A - ගැනුම් සැලසුම් කිරීම හා පාලනය
B - ක්‍රියාවලි හා යන්ත්‍රෝපකරණ පාලනය
C - ගිණුම්කරණ පද්ධතිය
D - සේවක වැටුප් පද්ධතිය
E - පරිගණක ආධාර නිර්මාණය
F - සේවක පැමිණීම

මෙහෙයුම් තොරතුරු පද්ධතියට පමණක් අදාළ උප-පද්ධති ඇතුළත් කාණ්ඩය තෝරන්න,

(1) A, B, C (2) A, B, E (3) A, D, F (4) B, C, F (5) D, E, F (.........)

**28.** කේවල ස්වාමි ව්‍යාපාරයක සාර්ථකත්වය මැනීම සඳහා භාවිත කළ **නොහැකි** මිනුම් දණ්ඩක් වන්නේ,

(1) නිෂ්පාදනයේ හෝ සේවාවේ ගුණත්වය වේ. (2) මූල්‍ය කාර්යසාධනය වේ.

(3) අයිතිකරුගේ අධ්‍යාපන මට්ටම වේ. (4) අයිතිකරුගේ ව්‍යවසායකත්ව කුසලතා වේ.

(5) සේවක සංඛ්‍යාව වේ. (.........)

**29.** ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය ලේඛනයක අඩංගු **නොවන** අයිතමයක් වන්නේ,

(1) ඉඩම් හා ගොඩනැගිලි සඳහා දරනු ලබන පිරිවැය වේ. (2) ව්‍යාපාර ආරම්භ කිරීමේ පිරිවැය වේ.

(3) කීර්තිනාමය වේ. (4) ණය වාරික ගෙවීම් වේ.

(5) පරිපාලන වියදම් වේ. (.........)

**30.** පහත සඳහන් දැ අතුරෙන් මූල්‍ය සැලැස්මක ඇතුළත් **නොවන්නේ,**

(1) ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශයයි. (2) ණය ආපසු ගෙවීමේ සටහනයි.

(3) ප්‍රාග්ධන අවශ්‍යතායි. (4) ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයයි.

(5) සේවක අනුප්‍රාප්තික සැලැස්මයි. (.........)

- අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) විවිධ පාර්ශ්වයන් අතුරෙන් ව්‍යාපාර තම පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා.............................. පිළිබඳ සැලකිලිමත් වන අතර, යටිතල පහසුකම් ලබා ගැනීම සඳහා .............................. පිළිබඳ සැලකිලිමත් වේ.

(ආ) ව්‍යාපාරයක හර පද්ධතිය .............................. පරිසර සාධකයක් වන අතර, තාක්ෂණය .............................. පරිසර සාධකයකි.

**32.** (අ) බදු ආදායම .............................. යටතේ ද, වර්තන වියදම .............................. යටතේ ද වර්ග කළ හැකි ය.

(ආ) වාණිජ බැංකු හා ප්‍රාථමික අලෙවිකරුවන් රජයේ සුරැකුම්පත් ඇපයට තබා මහ බැංකුවෙන් අරමුදල් ලබා ගැනීමේ දී අය කරනු ලබන පොලී අනුපාතය .............................. ලෙසත්, මහ බැංකුව විසින් තෝරා ගත් ක්ෂේත්‍ර සඳහා ලබා දෙන ණය සීමා පැනවීම .............................. ලෙසත් හඳුන්වනු ලැබේ.

**33.** හවුල් ව්‍යාපාරයක හා සීමාසහිත පෞද්ගලික සමාගමක මූලික ලක්ෂණ පදනම් කරගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

| නිර්ණායක | හවුල් ව්‍යාපාරය | සීමාසහිත පෞද්ගලික සමාගම (Pvt) |
|---|---|---|
| 1. සාමාජික සංඛ්‍යාව | 2 - 20 | .............................. |
| 2. වගකීම | .............................. | සීමිතයි |
| 3. .............................. | එකඟ වූ පරිදි | කොටස් |
| 4. කළමනාකරණය | හවුල්කරුවන් | .............................. |

PAPERMASTER.LK

**34.** (අ) සමාගමක කොටස්කරුවකු වීම සඳහා අනිවාර්යයෙන් ම සපුරාලිය යුතු කොන්දේසි **දෙක** වන්නේ ............................... හා ........................................................ ය.

(ආ) ශ්‍රී ලංකාවේ වරලත් ව්‍යාපාර සඳහා උදාහරණ **දෙකක්** වන්නේ ............................................. හා ................................................. ය.

**35.** ආයතනයක හදිසි පිටවීමේ දොරටුව (Emergency Exit) පෙන්වන ඊතලය සහිත පුවරුව ............................ හා ............................ සන්නිවේදන ක්‍රමයක් වශයෙන් සැලකිය හැකි අතර, ආයතනය විසින් පාරිභෝගිකයකුට යවන ලද ලිපිය ................................. හා ...................................... සන්නිවේදන ක්‍රමයකි.

**36.** (අ) අපනයනය කිරීමේ දී එම භාණ්ඩ අපනයනය කළ රටේ නිපදවා ඇති බවට පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ලියවිල්ල ................................................... වේ.

(ආ) ආනයනය කළ භාණ්ඩ ආනයනය කළ රට තුළ දී රේගු අධීක්ෂණය යටතේ අගයන් එකතු කිරීමෙන් පසුව අපනයනය කිරීම ........................................ වේ.

**37.** (අ) සේවකයින් ........................................ තම දායකත්වය ලබාදීම අභිප්‍රේරණයේ ප්‍රධාන ලක්ෂණය වේ.

(ආ) ආයතනයක භාවිත කරනු ලබන කළමනාකරණ පාලන විධි **දෙකක්** ලෙස ............................... හා ........................................ දැක්විය හැකි ය.

**38.** නිෂ්පාදන ක්‍රම වර්ගීකරණය සැලකිල්ලට ගනිමින් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| **නිර්ණායක** | **කාර්ය නිෂ්පාදන** | **ප්‍රවාහ නිෂ්පාදන** |
|---|---|---|
| 1. නිමැවුම් පරිමාණය | ................................ | ................................ |
| 2. ........................................ | ................................ | එක් නිෂ්පාදනයක් පමණයි |

**39.** (අ) නිෂ්පාදන ක්‍රියාවලියේ එක් අදියරක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය සියලු දෑ එක් ස්ථානයකින් කළ හැකි ආකාරයට බිම් සැලැස්ම/පිරියත (Lay out) නිර්මාණය කිරීම ........................................ වන අතර, සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යන් අඛණ්ඩ ව ගලා යන ආකාරයට බිම් සැලැස්ම/පිරියත නිර්මාණය කිරීම ........................................වේ.

(ආ) ආර්ථික ඇණවුම් ප්‍රමාණයේ දී (EOQ) ........................................ පිරිවැය හා ........................................ පිරිවැය එකිනෙකට සමාන වේ.

**40.** (අ) කොළඹ කොටස් වෙළෙඳපොළෙහි වර්තමානයේ භාවිතවන මිල දර්ශක **දෙක** වනුයේ ............................... හා ........................................................ ය.

(ආ) විදේශිකයින් කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ගනුදෙනුවලට සම්බන්ධ වන්නේ ............................... ගිණුම් හරහා වන අතර මෙම ගිණුම් පවත්වාගෙන යන බැංකු ............................... නමින් හැඳින්වේ.

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

**41.** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආර්ථිකයේ මුදල් සැපයුම පාලනය කරන ආකාර **හතරක්** ලියන්න.

1. ........................................................................
2. ........................................................................
3. ........................................................................
4. ........................................................................

**42.** විසිතුරු මල් වගා කිරීමේ ව්‍යාපාරයක් සඳහා ඔබට රජයෙන් ලබාගත හැකි සේවා **දෙකක්** හා ඒවා ලබාගත හැකි ආයතන **දෙකක** නම් පහත වගුවේ ලියන්න.

| **සේවා** | **ආයතන** |
|---|---|
| 1. ........................................ | ........................................ |
| 2. ........................................ | ........................................ |

PAPERMASTER.LK

**43.** සුළු ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා රජයෙන් හෝ වෙනත් ආයතනවලින් ලබාදෙන සේවා වර්ග **හතරක්** ලියන්න.

1. ............................................ 2. ............................................

3. ............................................ 4. ............................................

**44.** නියෝජිත කාර්යය අනුව එක් එක් නියෝජිතයා නම් කර, ඔවුන් විසින් ලබාගන්නා නියෝජිත ගාස්තු පහත සඳහන් වගුවෙහි දක්වන්න.

| කාර්යය | නියෝජිතයා | නියෝජිත ගාස්තුව |
|---|---|---|
| 1. ප්‍රධානියා වෙනුවෙන් ඔහුගේ ණයට විකුණුම්වල ණය මුදල් එකතු කිරීම | .................................... | .................................... |
| 2. ප්‍රධානියා වෙනුවෙන් විවෘතව හා වාචික ව ඉහළ මිල ගණන් සඳහා අලෙවි කටයුතු සම්බන්ධීකරණය කිරීම | .................................... | .................................... |

**45.** ජාත්‍යන්තර වෙළෙඳාමේ දී භාවිත වන පහත සඳහන් කෙටි යෙදුම්වල පූර්ණ නාමය ඒ ඉදිරියෙන් ලියන්න.

1. CIF : ..........................................................................................
2. FOB : ..........................................................................................
3. L / C : ..........................................................................................
4. B / L : ..........................................................................................

**46.** (අ) ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන **දෙකක්** ලියන්න.

1. ............................................ 2. ............................................

(ආ) විද්‍යුත් මුදල් පසුම්බියක් (e-wallet) භාවිත කිරීමේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

**47.** වෘත්තිය සමිතියක් ඇති කරගැනීමේ ප්‍රධාන අරමුණු **හතරක්** ලියන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

**48.** තොරතුරු වර්ගීකරණයේ නිර්ණායක **හතරක්** ලියන්න.

1. ............................................ 2. ............................................
3. ............................................ 4. ............................................

**49.** සංවිධාන සටහනකින් පෙන්නුම් කළ හැකි සංවිධාන ව්‍යුහයක ලක්ෂණ **හතරක්** ලියන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

**50.** භාණ්ඩ ඇසුරුම්වල සඳහන්, පොදුවේ භාවිත කරන සංකේත කිහිපයක් පහත දැක්වේ. එම සංකේතවලින් අදහස් කරන්නේ කුමක් දැ'යි සඳහන් කරන්න.

1.  ..........................................................................

2.  ..........................................................................

3.  ..........................................................................

4.  ..........................................................................

PAPERMASTER.LK

***

66237

AL/2015/32/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස්:**

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) ව්‍යාපාර ආයතන සමාජ සංවිධාන පද්ධතියේ කොටසකි.
   (අ) සෑම සංවිධානයකට ම පොදු වූ ලක්ෂණ ඇත. විධිමත් ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.
   (ආ) "සමාජයේ පැවැත්මට ව්‍යාපාර අත්‍යවශ්‍ය වේ." ව්‍යාපාර නිර්වචනය කරමින් මෙම අදහස පැහැදිලි කරන්න.
   (ලකුණු 04 යි)

   (ii) ව්‍යාපාරයක සාර්ථක හෝ අසාර්ථක බවට එහි අභ්‍යන්තර හා බාහිර පරිසරයන් බලපානු ලැබේ.
   (අ) ව්‍යාපාරයකට බලපාන අභ්‍යන්තර පරිසර සාධක **දෙකක්** නම් කර, ඒවා ව්‍යාපාරයේ සාර්ථකත්වය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.
   (ආ) ව්‍යාපාරයකට බලපාන සාර්ව පරිසර සාධක **දෙකක්** නම් කර, ඒවා ව්‍යාපාරයේ අසාර්ථකත්වය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.
   (ලකුණු 04 යි)

   (iii) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර අංශය තුළ සේවා සපයන ආයතන බහුල ව දක්නට ලැබේ.
   (අ) ව්‍යාපාර උපකාරක සේවා **හතරක්** සඳහන් කරන්න.
   (ආ) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන සේවා **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

   (iv) වර්තමානයේ ව්‍යාපාර බොහොමයක් සමාජ වගකීම් ඉටු කිරීම සඳහා විශාල මුදලක් වැය කරනු ලැබේ.
   (අ) සමාජ වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට ලබා ගත හැකි ප්‍රතිලාභ **හතරක්** ලියන්න.
   (ආ) ව්‍යාපාරික ආචාරධර්ම පද්ධතියක් සැකසීමේ දී සැලකිලිමත් විය යුතු සාධක **දෙකක්** උදාහරණ සහිත ව විස්තර කරන්න.
   (ලකුණු 04 යි)

   (v) යෝගට්වල ගුණත්වය පිළිබඳ ව පාරිභෝගිකයින්ගෙන් පැමිණිලි රාශියක් ලැබූ පසු යෝගට් නිෂ්පාදනාගාරයක හිමිකරුවකු වන සමන්ත විසින් තත්ත්වයෙන් ඉතා හොඳ අමුද්‍රව්‍ය භාවිත කර ගුණත්වය ඉහළ නැංවීමට තීරණය කරන ලදී. සමන්තගේ මෙම තීරණය භාණ්ඩයේ ගුණත්වය ඉහළ දැමීමට ඉවහල් වන්නේ දැ'යි පැහැදිලි කරන්න.
   (ලකුණු 04 යි)
   (මුළු ලකුණු 20 යි)

2. (i) (අ) ව්‍යාපාරයකට රටක ආර්ථික සංවර්ධනය සඳහා දායක විය හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න.
   (ආ) පාරිභෝගික අයිතිවාසිකම් **දෙකක්** නම් කර, ඒවා සුරැකීම සඳහා ව්‍යාපාරිකයකු විසින් ඉටු කළ යුතු යුතුකම් මොනවා දැ'යි පැහැදිලි කරන්න.
   (ලකුණු 04 යි)

   (ii) (අ) ශ්‍රී ලංකාවේ ඇතැම් ව්‍යාපාරිකයින් විසින් සිදු කරනු ලබන වෙළෙඳ විෂමාචාර **හතරක්** සඳහන් කරන්න.
   (ආ) එම විෂමාචාර වැළැක්වීම සඳහා රජයට ගතහැකි ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

   (iii) (අ) හවුල් ව්‍යාපාරයක්, වරලත් ව්‍යාපාරයකින් වෙනස් වන්නේ කෙසේ දැ'යි පැහැදිලි කරන්න.
   (ආ) වර්තමානයේ ශ්‍රී ලංකාවේ වරලත් ව්‍යාපාර ආරම්භ කිරීම කෙරෙහි වැඩි නැඹුරුවක් දක්නට ලැබේ. වරලත් ව්‍යාපාරයකින් වරලත්ලාභියකුට ලබාගත හැකි වාසි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

   (iv) (අ) ශ්‍රී ලංකාවේ රජය නිෂ්පාදන අංශයට වඩා සේවා අංශයෙහි ව්‍යාපාරවල නියුක්තවීමට වැඩි ප්‍රමුඛතාවක් දෙනු ලැබේ. එසේ වැඩි ප්‍රමුඛතාවක් ලබා දීමට බලපාන හේතු උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
   (ආ) "රජයක් සිය අරමුණු ඉටුකර ගැනීමේ දී ව්‍යාපාර අංශයෙන් සහයෝගය අපේක්ෂා කරන අතර ව්‍යාපාර අංශය ද එම අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ ආකාරයෙන් සිය දායකත්වය ලබා දේ." මෙම ප්‍රකාශය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
   (ලකුණු 04 යි)

   (v) දේශීය ගොවීන් ආරක්ෂා කර ගැනීම සඳහා රජය විසින් ආනයනික අර්තාපල් හා ලූනු සඳහා බද්දක් අය කිරීමට යෝජනා කර ඇත. මෙම බදු අය කිරීම තුළින් දේශීය ගොවීන්ට සහ පාරිභෝගිකයින්ට ඇති විය හැකි බලපෑම් පැහැදිලි කරන්න.
   (ලකුණු 04 යි)
   (මුළු ලකුණු 20 යි)

PAPERMASTER.LK

[ දෙවැනි පිටුව බලන්න.

**3.** (i) (අ) ව්‍යවසායකත්වය, රටක දියුණුවට අත්‍යවශ්‍ය සාධකයකි. මෙම අදහස උදාහරණ **හතරක්** දක්වමින් පැහැදිලි කරන්න.

(ආ) සිරිපාලගේ පියා සාර්ථක ව්‍යාපාරිකයෙකි. සිරිපාලට ද ඇතැම් ව්‍යවසායක කුසලතා පැවතුන ද, ඔහුගේ පියා විසින් නිරතුරු ව අවධාරණය කර සිටින්නේ තවදුරටත් ඔහු විසින් ඔහුගේ ව්‍යවසායක කුසලතා වර්ධනය කරගත යුතු බව ය. සිරිපාල හට ව්‍යවසායක කුසලතා වර්ධනය කරගත හැකි මාර්ග **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(ii) රුපියල් මිලියන දෙකක මුදලක් ඔබ අත ඇත්නම් එම මුදල ඉඩමක් මිල දී ගැනීමට වැය කරන්නේ ද, නැතිනම් කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කරන්නේ ද? ඔබ ගන්නා තීරණය මෙම විකල්ප දෙක සංසන්දනය කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) මහා පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට වඩා සුළු පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීම කෙරෙහි පුද්ගලයින් උනන්දු වීමට බලපාන හේතු **හතරක්** පැහැදිලි කරන්න.

(ආ) දැඩි තරගකාරිත්වයට මුහුණ දී සිටින සුළු පරිමාණ සිල්ලර ව්‍යාපාරිකයකු හට පාරිභෝගිකයින් අද්දවා ගැනීමට ගත හැකි උපායමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) දාතම, මුදල (අකුරෙන් හා ඉලක්කමෙන්) සහ අත්සන නිවැරදි ව මුදල් චෙක්පතක සඳහන් කර තිබුණද බැංකු අයකැමි විසින් එම චෙක්පතට බැංකු කවුන්ටරයෙන් මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදී. එලෙස මුදල් නොගෙවීමට හේතුවිය හැකි කරුණු **හතරක්** ලියන්න.

(ආ) වාණිජ බැංකු විසින් ව්‍යාපාර සඳහා විවිධාකාරයේ සේවා සපයනු ලැබේ. එවැනි සේවා **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) "සමූපකාර ග්‍රාමීය බැංකුවක් වෙනත් වාණිජ බැංකුවකින් වෙනස් නොවේ." ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) ශ්‍රී ලංකාව තුළ මූල්‍ය සමාගම්වල සීඝ්‍ර වර්ධනයක් වර්තමානයේ දක්නට ලැබේ. එසේ මූල්‍ය සමාගම් සීඝ්‍රයෙන් වර්ධනය වීමට හේතු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**4.** (i) (අ) ජීවිත රක්ෂණ වන්දියක් හා මෝටර් රථ රක්ෂණ වන්දියක් ලබා ගැනීමට යාමේ දී රක්ෂිතයාට මුහුණදීමට සිදුවිය හැකි ගැටලු **දෙක** බැගින් පැහැදිලි කරන්න.

(ආ) වෘත්තියෙන් වාදකයකු මෙන් ම ගායකයකු ද වන චන්ද්‍රසිරි බොහෝවිට දේශීය සංගීත සංදර්ශනවලට තම මෝටර් රථයෙන් ගමන් කරයි. එසේම ඔහු විදේශ සංගීත සංදර්ශනවලට ද සහභාගී වේ. චන්ද්‍රසිරිට මුහුණපෑමට සිදුවිය හැකි අවදානම් **හතරක්** නම් කර, එම අවදානම් වෙනුවෙන් ඔහුට ලබා ගත හැකි රක්ෂණ ඔප්පු මොනවා දැ'යි සඳහන් කරන්න. (ලකුණු 04 යි)


(ii) අධිවේගී මාර්ග පද්ධති සංවර්ධනය තුළින් ව්‍යාපාර අංශයේ ඇතිවිය හැකි විවිධ වෙනස්කම් මොනවා දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) සේවක මණ්ඩලය අමතා දේශනයක් පැවැත්වීමේ දී කළමනාකරුවකු විසින් අවධානයට ලක් කළ යුතු මූලික කරුණු **හතරක්** ලියන්න.

(ආ) පුද්ගලයින් දෙදෙනකු අතර ඇතිවන විද්‍යුත් සන්නිවේදනයේ සඵලදායීත්වය කෙරෙහි බලපෑ හැකි බාධා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) තොග වෙළෙන්දා භාණ්ඩ බෙදාහැරීමේ ක්‍රියාවලිය තුළින් ඉවත් කිරීමට 'පක්ෂ ව' හා 'විපක්ෂ ව' කරුණු **දෙක** බැගින් දක්වන්න. (ලකුණු 04 යි)

(v) (අ) කෘෂි රසායනික නිෂ්පාදන ආනයන ක්‍රියාවලියේ පියවර කිහිපයක් පහත සටහනෙහි දැක්වේ.




ඉහත ක්‍රියාවලියෙහි දැක්වෙන **A**, **B**, **C** හා **D** ස්ථාන සඳහා අදාළ පියවර ඔබගේ පිළිතුරු පත්‍රයෙහි දක්වන්න.

(ආ) ණය කාඩ්පත් (Credit cards) මගින් සිදු කරනු ලැබූ ගනුදෙනු පියවීම පහසු කිරීම සඳහා භාවිත කළ හැකි පහසුකම් **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

PAPERMASTER.LK

[ තුන්වැනි පිටුව බලන්න.

## II කොටස

**5.** (i) කළමනාකරුවකුගේ පහත සඳහන් භූමිකාවලට උදාහරණය බැගින් සපයන්න.

(අ) නායකයා (ආ) තොරතුරු බෙදාහරින්නා

(ඇ) ව්‍යවසායකයා (ඈ) සම්පත් වෙන්කරදෙන්නා (ලකුණු 04 යි)

(ii) "නායකත්වය සංවිධානයක සාර්ථකත්වයට අත්‍යවශ්‍ය වේ." මෙම අදහස පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) තෝරාගත් බේකරි නිෂ්පාදන කටයුත්තකට අදාළ නිෂ්පාදන ක්‍රියාවලිය එහි එක් එක් අදියරයන් සඳහා උදාහරණ සහිත ව සටහනකින් ඇඳ දක්වන්න. (ලකුණු 04 යි)

(iv) (අ) කුඩා ව්‍යාපාරිකයින් සඳහා දේශනයක් පවත්වන ඔබ සමච්ඡේද ලක්ෂ්‍ය විග්‍රහයේ වැදගත්කම ඔවුන්ට ඒත්තු ගැන්වීම සඳහා යොදා ගනු ලබන කරුණු **හතරක්** ලියන්න.

(ආ) "ප්‍රමිතීන් නොමැති ව සාර්ථක පාලන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ නොහැකි ය." මෙම ප්‍රකාශය පාලන ක්‍රියාවලිය ඇසුරෙන් තහවුරු කරන්න. (ලකුණු 04 යි)

(v) ලාභාලාභ රහිත ලක්ෂ්‍යයේ දී නිමැවුම් ප්‍රමාණය ඒකක 4 000 කි. විචල්‍ය පිරිවැය ඒකකයට රු. 10 කි.

(අ) ඒකකයක විකුණුම් මිල රු. 15 ක් නම්, මුළු ස්ථාවර පිරිවැය ගණනය කරන්න.

(ආ) රු. 10 000 ක ලාභයක් ලැබීම සඳහා විකිණිය යුතු මුළු ඒකක ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**6.** (i) (අ) සෑම වෙළෙඳපොළ බණ්ඩනයක් ම සඵලදායී නො වේ. සඵලදායී වෙළෙඳපොළ බණ්ඩනයක් සඳහා පැවතිය යුතු අවශ්‍යතා විස්තර කරන්න.

(ආ) නිමල් සාමාන්‍ය බස් රථ පහක් යොදාගෙන මගී ප්‍රවාහන සේවාවක් පවත්වා ගෙන යනු ලැබේ. පාරිභෝගික තෘප්තිය තවදුරටත් වර්ධනය කිරීම සඳහා නිමල් විසින් ඔහුගේ ප්‍රවාහන සේවාවට එකතු කළ යුතු අතිරේක පහසුකම් පිළිබඳ ව ඔබ විසින් ඔහුට ලබා දෙන යෝජනා මොනවා ද? (ලකුණු 04 යි)

(ii) (අ) ප්‍රාථමික ඇසුරුම් හා ද්විතීයික ඇසුරුම් යනු කුමක් දැ'යි විස්තර කරන්න.

(ආ) ඇසුරුම්කරණය තුළින් ව්‍යාපාරිකයකුට ලැබෙන වාසි **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන අරමුණු **හතරක්** සඳහන් කරන්න.

(ආ) මූල්‍යන තීරණ හා ආයෝජන තීරණ යනු මොනවා දැ'යි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) යසපාල මිරිස් තුනපහ කුඩුකර, පැකට් කර බෙදා හැරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටියි. ඔහුගේ දිගුකාලීන හා කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සඳහා උදාහරණ **දෙක** බැගින් දක්වන්න. (ලකුණු 04 යි)

(v) (අ) 'සංචිත ප්‍රාග්ධනීකරණය' යනුවෙන් හඳුන්වන්නේ කුමක් දැ'යි විස්තර කරන්න.

(ආ) පරිසර දූෂණය අවම කිරීම සඳහා නිෂ්පාදන ආයතනයකට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**7.** (i) රටක මූල්‍ය පද්ධතියේ සංයුතියට අඩංගු වන කොටස් **හතරක්** උදාහරණ සහිත ව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) කොළඹ කොටස් වෙළෙඳපොළෙහි පාර්ශ්වකරුවන් **හතරක්** නම් කරන්න.

(ආ) භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීමෙන් ගැනුම්කරුට ලබාගත හැකි වාසි මොනවා ද? (ලකුණු 04 යි)

(iii) කමල් සහ සරත් අලෙවි නියෝජිත තනතුරක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට සහභාගී වූහ. කමල් අධ්‍යාපනය ලබා ඇත්තේ 8 ශ්‍රේණිය දක්වා පමණකි. සරත් උසස් පෙළ විභාගය සමත් වී සිටි නමුදු සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ තනතුර සඳහා කමල් තෝරාගන්නා ලදී. මෙහිදී කමල් ව තෝරා ගැනීම සඳහා බලපානු ලැබූ කරුණු **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) මානව සම්පත් කළමනාකරණ කාර්යයන් දෙකක් මත පදනම් වී ඇති පහත වගුවෙහි අදාළ ස්ථානයන් සඳහා එක් කරුණ බැගින් සඳහන් කරමින් සම්පූර්ණ කරන්න. ( පිළිතුර සඳහා පහත දැක්වෙන ආකාරයේ වගුවක් භාවිත කරන්න.)

| කාර්යයන් / පාර්ශ්වයන් | කාර්යඵල ඇගයීම | | පුහුණුව හා සංවර්ධනය | |
|---|---|---|---|---|
| | වාසි | අවාසි | වාසි | අවාසි |
| සංවිධානයට | | | | |
| සේවකයින්ට | | | | |

(ලකුණු 04 යි)

(v) යහපත් සේව්‍ය-සේවක සම්බන්ධතා පවත්වා ගැනීමෙන් ආයතනයකට ලබාගත හැකි වාසි **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

PAPERMASTER.LK

(මුළු ලකුණු 20 යි)

8. (i) (අ) ව්‍යාපාර සඳහා දැනුම් ආර්ථිකය ප්‍රයෝජනවත් වන ආකාර **හතරක්** පැහැදිලි කරන්න.

(ආ) "තොරතුරු, දත්තවලට වඩා ප්‍රයෝජනවත් ය." මෙම ප්‍රකාශය දත්ත සහ තොරතුරු සංසන්දනය කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) තොරතුරු පද්ධතින්ගේ භාවිත ස්වභාවය පහත වගුව මගින් දැක්වේ. ( ①, ②, ③, ④, ⑤, ⑥, ⑦ හා ⑧ යන ස්ථානවලට අදාළ පිළිතුරු පමණක් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.)

| සංවිධාන මට්ටම | තොරතුරු පද්ධති | අවශ්‍ය වන්නේ කුමක් සඳහා ද | උදාහරණ |
|---|---|---|---|
| මෙහෙයුම් | ....①.... | දෛනික කටයුතු | ....②.... |
| දැනුම් | කාර්යාල ස්වයංකරණ | ....③.... | ....④.... |
| ....⑤.... | කළමනාකරණ | සැලසුම් හා පාලන | ....⑥.... |
| උපායශීලී | ....⑦.... | ....⑧.... | ආයෝජන ඇගයීම් |

(ලකුණු 04 යි)

(iii) (අ) අලෙවි සැලැස්මක අඩංගුවන 'තරගකාරිත්ව විශ්ලේෂණය' යටතේ සැලකිල්ලට ගත යුතු තොරතුරු අයිතමයන් **හතරක්** සඳහන් කරන්න.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක ඇතුළත් වන මුදල් ගලා ඒම්වලට නිදසුන් **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) (අ) 'පද්ධති මෘදුකාංග' හා 'යෙදවුම් මෘදුකාංග' අතර වෙනස විස්තර කරන්න.

(ආ) 'බස්ජාල' හා 'තාරකාජාල' විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශනයක දැක්වෙන ශුද්ධ විකුණුම් ගණනය කරන ආකාරය පෙන්වන්න.

(ආ) එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා අරමුදල් අවශ්‍ය වන ප්‍රධාන පිරිවැය අයිතම **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

* * *

PAPERMASTER.LK